# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## පුරප්පාඩු දැන්වීමයි

### අරක්කැමි (ජාතික නිවාඩු නිකේතන - පුරප්පාඩු 02)

### තනතුරට අදාල කාර්යයන්

- සේවා පරිසරය තුල සනීපාරක්ෂක සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතීන් පවත්වාගෙන යාම.
- ආහාර පිළියෙළ කරනු ලබන ස්ථානය පිරිසිදුව නඩත්තු කිරීම.
- පිළියෙළ කරනු ලබන නිශ්චිත ආහාර අයිතමයන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය මැනීම සිදුකිරීම.
- ආහාර වට්ටෝරු පත්‍රිකා හා ලැබෙන මුළුතැන්ගේ ඇනවුම් පත්‍රිකා අනුව හෝ වාචික උපදෙස් අනුව ආහාර වට්ටෝරු සැකසීම, සැලසුම් කිරීම හා පිළියෙළ කිරීම .
- කාලෙන් කාලයට විවිධ වට්ටෝරු හඳුන්වාදීම .
- එසේ සකසන ලද ආහාර අවශ්‍ය ප්‍රමිතියෙන් සහ ප්‍රමාණයෙන් යුක්ත ද යන්න තහවුරු කර ගැනීම.
- ප්‍රනීතව සහ සෞඛ්‍යාරක්ෂිතව ආහාර පාන පිළියෙළ කිරීම.
- විවිධ වර්ගයන්හී ආහාර හා පාන වර්ග පිළියෙළ කිරීම.
- වැඩ ස්ථානයන්හි අවශ්‍ය ද්‍රව්‍ය පිරිසිදුව ගබඩාකර තැබීම.
- ආහාර පිසීමේ වෙලාව සම්බන්ධීකරණය කිරීමට උපකාරීවීම පිණිස දෛනික ආහාර තොරතුරු පදනම්කර ගනිමින් කළමනාකරුවන් සමග උපකරණ භාවිතය සහ ක්‍රියාකාරකම් උපලේඛනගත කිරීම.
- පාරිභෝගිකයන්ගේ ඇනවුම් සඳහා ආහාර ද්‍රව්‍ය ඉදිරිපත් කිරීම.
- අංශභාර ප්‍රධානී හා/ හෝ ආයතන ප්‍රධානී විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරීන් ඉටුකිරීම.

### සුදුසුකම්

### බාහිර අයදුම්කරුවන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවය (NVQ) දෙවැනි **(2)** මට්ටමට නොඅඩු මට්ටමක අරක්කැමි තනතුරට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

අදාළ ක්ෂේත්‍රයේහි වසර පහක **(5)** පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූලවන වෘත්තීය පරීක්ෂණයකදී **(Trade Test)** තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවෙනි **(2)** මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

හෝ

*තනතුරෙහි කාර්ය භාරයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවෙනි (2) මට්ටමට නොඅඩු මට්ටමට ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.*

***වයස***

*අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.*

### *වැටුප් පරිමාණය*

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| PL 2 | රු. 25,750/- | 10 x රු.270/- | 10 x රු.300/- | 10 x රු.330/- | 12 x රු.350/- | රු.38,950/- |

### *මූලික වැටුප් තලය*

*රු. 25.750/- + ජීවන වියදම් දීමනාව + විශේෂ දීමනාව*

*ප්‍රතිලාභ*

- *සේවකයා සහ පවුල ආවරණය වන ආකර්ශනීය වෛද්‍ය රක්ෂණ ක්‍රමයක්*
- *ණය පහසුකම්*
- *වෘත්තීය දියුණුව සඳහා පුහුණු අවස්ථා*
- *ප්‍රවාහන දීමනාව*

***සටහන***

***තෝරා පත් කරගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුරාධපුර, කතරගම, බණ්ඩාරවෙල හා නුවරඑළිය ස්ථානවල පිහිටි ඕනෑම ජාතික නිවාඩු නිකේතනයක සේවය භාර ගැනීමට සූදානම් විය යුතුය.***

*උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරන අපේක්ෂකයින් අපගේ වෙබ් අඩවියෙන් https://www.sltda.gov.lk/en/careers අයදුම්පත බාගත කල හැකිය.*

*ඔබ රැකියාවට සුදුසු යැයි සිතන්නේ නම් ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ඇතුලත් ඔබගේ ජීව දත්ත (CV), අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්වල සහතික පත්වල පිටපත්, සේවා පළපුරුද්ද ඇතුලත් සේවා සහතිකවල පිටපත් සමඟ සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය ලියාපදිංචි තැපැල හරහා සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, නො. 80, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට **2024 දෙසැම්බර් 13** දින හෝ ඊට පෙර එවන්න.*

*ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර ඔබ අයදුම්කරන තනතුර සඳහන් කරන්න.*

*රජයේ දෙපාර්තමේන්තු/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ඉදිරිපත් කල යුතුය.*

***සභාපති***
***ශ්‍රී ලංකා සංචාරක සවංර්ධන අධිකාරිය***
***නො. 80, ගාලු පාර***
***කොළඹ 03***